# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
14 වන මහල,සුහුරුපාය,බත්තරමුල්ල

| | | | |
|---|---|---|---|
| දිනය Date | 2025.12.01 පැය 2115 | දුරකථන අංකය Tel.NO | 011-2887973 |
| මගේ අංකය My NO | D/Media/Out/2158/2025 | විද්‍යුත් ලිපිනය E-Mails | dir.media@police.gov.lk |


**ආපදා තත්ත්වය හේතුවෙන් අවතැන් වූ පිරිස් වෙත වියළි සලාක බෙදා දීම සහ වෛද්‍ය සේවා කඳවුරක් පැවැත්වීම.**

දිවයිනට බලපෑ අයහපත් කාළගුණික තත්ත්වය හේතුවෙන් ග්‍රෑන්ඩ්පාස් පොලිස් වසමේ වෙහෙරගොඩැල්ල විද්‍යාල පරිශ්‍රයේ රැඳී සිටින අවතැන් වූවන් වෙත වියළි සලාක බෙදා දීම හා ඔවුනට අවශ්‍ය වෛද්‍ය ප්‍රතිකාර ලබා දීම සඳහා පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසය මඟින් සංවිධානය කරන ලද වෛද්‍ය සේවා කඳවුරක් 2025.12.01 වන අද දින පොලිස්පති ප්‍රියන්ත වීරසූරිය මහතාගේ ප්‍රධානත්වයෙන් සිදු කරන ලදී.

මෙම අවස්ථාව සඳහා සහයක සේවා ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති රාජිත ශ්‍රී දමින්ද මහතා, බස්නාහිර පළාත භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති සජීව මැදවත්ත මහතා, කොළඹ දිසාව භාර නියෝජ්‍ය පොලිස්පති නිශාන්ත ද සොයිසා මහතා, කොළඹ උතුර භාර ජ්‍යෙෂ්ඨ පොලිස් අධිකාරි රෝහණ පුෂ්පකුමාර මහතා හා පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසයේ අධ්‍යක්ෂ මදාරා ආරියසේන මහත්මිය ඇතුළු උසස් නිලධාරීන් පිරිසක් සහභාගි විය.

එම අවස්ථාවට අදාල ඡායාරූප




හදිසි ප්‍රථමාධාර හා මූලික වෛද්‍යාධාර ඒකකය
Emergency First Aid &
Basic Medical Treatment Unit
Tel. & WhatsApp :070 3680888 Email : emergencyfirstaidunit@gmail.com


















අයහපත් කාළගුණය හේතුවෙන්
පීඩාවට පත් අපේම සහෘද ජනතාව වෙනුවෙන්
පොලිස් වෛද්‍ය සේවා කොට්ඨාසයේ ප්‍රජාසත්කාරයකි.

